දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය) අප්‍රේල් 2017

ග්‍රීක හා රෝම අධ්‍යයනය

GRS E 102

**ග්‍රීක රෝම විද්‍යාව සහ ජීවිතය**

**ප්‍රශ්න පහකට** පිළිතුරු සපයන්න.

මෙහි ඇති සියලු ප්‍රශ්න ප්‍රමාණය දහයකි.

(කාලය - පැය තුනයි)

---

1. **එක්කෝ**

   (i) ග්‍රීකවරු ඔවුන්ගේ දෙවියන් උදෙසා පුදපූජා කළ ආකාරය පිළිබඳව රචනයක් ලියන්න.

   **නැතහොත්**

   (ii) "රෝමවරු සෑම දෙයකම සහ සෑම දෙසකම දෙවියන් දුටුවහ." මෙම කියමන රෝමවරු ඇදහූ ආගම ඇසුරින් සාකච්ඡා කරන්න.

2. ග්‍රීක සහ රෝම නිමිති කීමේ ක්‍රම (modes of divination) තුලනාත්මකව සාකච්ඡා කරන්න.

3. මළවුන්ගේ ජීවිතය පිළිබඳව හෝමර්ගේ අදහස ඔහුගේ **ඔඩිසි** වීරකාව්‍යයේ එකළොස්වන පරිච්ඡේදයට විශේෂ අවධානයක් යොමු කරමින් සාකච්ඡා කරන්න.

4. **එක්කෝ**

   (i) ඇතීනියන්වරු සහ ස්පාර්ටන්වරු ඔවුන්ගේ දරුවන්ට සැපයූ අධ්‍යාපන ක්‍රම තුලනාත්මකව සාකච්ඡා කරන්න.

   **නැතහොත්**

   (ii) අධ්‍යාපනඥයෙක් ලෙසින් ක්වින්ටිලියන් (Quintilian) දැරූ අදහස් අගයන්න.

5. ග්‍රීසියේ පැවැත්වූ ප්‍රධාන මලල ක්‍රීඩා උත්සව එම උත්සව අවස්ථාවන්හිදී පැවැත්වූ තරඟ ඉසව් පිළිබඳව සඳහන් කරමින් සාකච්ඡා කරන්න.

6. **එක්කෝ**

(i) හිපොක්‍රටික් ලේඛණය (Hippocratic Corpus) යනු කුමක්ද? ග්‍රීක වෛද්‍ය විද්‍යාවේ දියුණුව කෙරෙහි එහි වැදගත්කම සහ එය දැක්වූ දායකත්වය විමර්ශනය කරන්න.

**නැතහොත්**

( ii ) ගේලන් යනු කවරෙක්ද? ශෛල්‍ය වෛද්‍ය විද්‍යාවේ දියුණුව කෙරෙහි ඔහුගේ දායකත්වය විමර්ශනය කරන්න.

7. "ග්‍රීකවරු ඔවුන්ගේ යුධ උපක්‍රමයක් ලෙසින් සොභාවික භූමි පිහිටීම යොදා ගත්හ." පර්සියානු යුද්ධය ඇසුරින් මෙම කියමන උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

8. සම්භාව්‍ය ඇතන්ස්හි පුද්ගලයෙකු වහලකුබවට පත්වූ ක්‍රම රෝමයේ දක්නට ලැබුණු එවන් ක්‍රමවලට කෙතෙක් සමගාමී ව පැවතියේද යන්න පිළිබඳව අවධානය යොමු කරමින් විස්තර කරන්න.

9. රෝම අධිරාජ්‍ය සමයේ විසූ බලවත් කාන්තා චරිත 2ක් පිළිබඳව ඔවුන්ගේ චරිතය, ප්‍රභූත්වය හා රෝම අධිරාජ්‍යයන් සමග වූ සබඳතාවන් ආදී කරුණු සැලකිල්ලට ගනිමින් රචනයක් ලියන්න.

10. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ඩෙල්ෆි අනාගත වක්තෘ (Delphic Oracle).
(ii) හොප්ලයිට් සෙබලුන් (Hoplite soldiers)
( iii ) සැෆෝ (Sappho).
(iv) පෙනලෝපි රැජින (Queen Penelope)
(v) ග්ලැඩියේටර්වරු (Gladiators).
(vi) සර්කස් මැක්සිමස් (Circus Maximus).
( vii ) රෝම තුරග රථ තරඟ (Roman chariot races)